**අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දී ඇටඹගහ හන්දිය ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීම සඳහා වැයකර තිබූ රු.156,756 ක්, පුර නැගුම ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන කාර්යාලයේ කාමර වෙන්කිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු.250,442 ක් සහ රු.21,825 ක් වැයකර මිලට ගෙන තිබූ කැමරාවක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොළී රු.64,062 ක් ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.28,564 ක් වූ පාරිභෝගික භාණ්ඩ, ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.4,015,095 ක් ණයහිමියෝ ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්

**---------------------**

ගිණුම් විෂයකට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.32,841,200 ක ශේෂය හා උපයෝගී ලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.510,713 වෙනසක් විය.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------

**(අ) ලැබිය යුතු ගිණුම්**

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2016 වර්ෂයේ කර්මාන්ත ණයගැතියෝ යටතේ ලැබිය යුතු රු.75,426 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2008 වර්ෂයේ සිට ඉදිරියට එන ලැබිය යුතු තැන්පත් රු.47,466 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2014 වර්ෂයේ කර්මාන්ත ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත් සමාගම් වෙත තාර ලබාදීම වෙනුවෙන් ලැබිය යුතු රු.2,791,487 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

--------------------

2015 වර්ෂයේ සිට කර්මාන්ත ණයහිමියෝ 19 ක් සඳහා ගෙවිය යුතු රු.15,260,488 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

**---------------------------------------------------**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

--------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.83,145,517 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

---------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි කළමනාකරණ තීරණ වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම්** |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | | |
| (i) රීති 33 | - | අක්කර බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. |
| (ii) රීති 164 | - | සභාවේ ගිණුම් ලියවිලි දිනපතා පරීක්ෂා කර, එහි අන්තර්ගත සටහන් නිවැරදි බවට කෙටි අත්සන් යොදා සහතික කර |

| | | | |
|---|---|---|---|
| | | | නොතිබුණි. |
| (iii) රීති 184 | | - | ඇප තැබිය යුතු නිලධාරීන් 06 ක ගෙන් ඇප මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) රීති 196 | | - | ටයර් සහ තාර නිකුත් කිරීම සම්බන්ධ ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (v) රීති 218 | | - | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| **(ආ)** | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1)(2) | 2,853,449 | වර්ෂ 02 ක කාලය ඉක්මවා තිබුණු තැන්පතු ශේෂ 82 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,607,197 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,771,711 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

සමාලෝචිත වර්ෂයේ දී සභාව සතු බැංකු ජංගම ගිණුම් 03 ක රු.52,468,452 ක මාසික සාමාන්‍ය ශේෂයක් පැවති නමුත්, එම අතිරික්ත මුදල් ආයෝජනය කර, පොලී ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 18,000 | 16,325 | 3,879 | 213,006 | 18,000 | 16,325 | 7,225 | 199,935 |
| (ii) | කුලී | 2,600,000 | 2,300,060 | 1,781,705 | 561,697 | 2,000,000 | 2,058,560 | 2,477,794 | 42,070 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,600,000 | 1,328,260 | 1,216,285 | 111,975 | 1,300,000 | 1,364,400 | 1,165,560 | 198,840 |
| | | 4,218,000 | 3,644,645 | 3,001,869 | 886,678 | 3,318,000 | 3,439,285 | 3,650,579 | 440,845 |

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ සභාවේ ඇස්තමේන්තුගත ආදායම් රු.4,218,000 ක් හා බිල් කිරීම් රු.3,644,645 ක් විය. ඒ අනුව මුළු ඇස්තමේන්තුගත ආදායමෙන් බිල් කළ ආදායම සියයට 86 ක් වූ අතර, මුළු බිල් කළ ආදායමෙන් රැස්කළ ආදායම සියයට 82 ක් විය.

### 2.3.3 වරිපනම් හා අක්කර බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ බිල් කිරීම්වලින් රැස් කිරීම් සියයට 24 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය ආරම්භයට වූ රු.199,935 ක් වූ අක්කර බදු ශේෂය වර්ෂය අවසාන වනවිට රු.213,006 ක් වූයෙන් ආරම්භක ශේෂයට සාපේක්ෂව හිඟය සියයට 06 කින් වර්ධනය වී තිබුණි. හිඟ ශේෂ අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ ප්‍රධාන ආදායම් මාර්ගය වූ අක්කර බදු ආදායම් බිල් කිරීම 2017 වර්ෂයේ රු.16,325 ක් වැනි සුළු අගයක් ගෙන තිබුණි. අක්කර බදු ලේඛනයට අනුව දේපල හිමියන් 311 දෙනෙකු සිටිය ද, යාවත්කාලීනව අක්කර බදු ගෙවා තිබුණේ දේපල හිමියන් 11 ක් පමණි.

### 2.3.4 බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.111,975 ක හිඟ ශේෂයක් නිරීක්ෂණය වූ අතර, හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

### 2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.2,129,737 ක් හා මුද්දර ගාස්තු රු.27,114,680 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යයසාධනය

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

----------------------

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 16 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත්, එහි සඳහන් කිසිදු කර්තව්‍යයක් ඉටුකර නොතිබුණි.

**(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

----------------------------------------

සභාවට අයත් මීටියාගොඩ ආයුර්වේද බෙහෙත් ශාලාව 2017 වර්ෂය පුරා වසා තිබීම හේතුවෙන් සභා බලප්‍රදේශයේ ජීවත්වන ජනතාව බලාපොරොත්තු වූ සේවය ලබාගත නොහැකි වී තිබුණි.

**(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

සභාවට අයත් පර්චස් 40 ක් පමණ වූ දෙල්ගහබැද්ද ඉඩමට දිනකට ටොන් 03 ක් පමණ දිරන හා නොදිරන වශයෙන් වෙන් කර, කසළ බැහැර කරමින් තිබුණි. දිරන කසළ යොදාගෙන කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන අතර, පොහොර නිෂ්පාදනය සඳහා යොදාගන්නා යන්ත්‍ර අක්‍රියවීම හේතුවෙන් මාස 02 ක පමණ කාලයක සිට පොහොර නිෂ්පාදන අඩාල වී තිබුණි. නොදිරන කසළ විශාල වශයෙන් ගොඩගැසී තිබුණු අතර, කසළ බැහැර කරන ඉඩමට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.

(ඈ) **තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**(ඉ) ඉටු නොකළ කර්තව්‍යයන්**

----------------------------

2016 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්මේ උපමානපාදක ප්‍රදාන යටතේ මැටිවල හපුතන්ත්‍රීගෙ වත්ත පළමු පටුමග සංවර්ධනය කිරීම සඳහා රු.1,650,000 ක් ලැබී ඇස්තමේන්තු සකස් කර තිබුණ ද, එම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාර සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශවල නගර හා නගරාශ්‍රිත නිවාස වලින් වරිපනම් බදු අයකර ගැනීමේ හැකියාව තිබිය දී ඒ සඳහා පියවර ගෙන නොතිබුණි.

(ii) සභාව විසින් වීථි පහන් නඩත්තු සම්බන්ධයෙන් විදුලිබල මණ්ඩලය සමග ගිවිසුම්ගත නොවීමෙන් 2017 වර්ෂය තුළ වීථි පහන් සඳහා දරන ලද රු.1,468,697 ක වියදම් ප්‍රතිපූර්ණය වී නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

--------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සේවක සංඛ්‍යා සැලැස්ම අනුව තනතුරු 06 ක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා 24 ක් වූ අතිරික්ත සේවකයින් විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ii) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව සභාව විසින් ආදේශක පදනම මත බඳවාගෙන තිබූ සේවකයින් 14 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.3,599,436 ක් ගෙවා තිබුණි.

**(ආ) සේවක ණය**

--------------

සේවයෙන් විශ්‍රාම ගිය, විදේශගත, සේවය හැර ගිය හා මිය ගිය සේවකයින් 12 දෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.195,869 ක් 1997 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඉදිරියට ගෙනවිත් තිබුණු අතර, අදාළ සේවකයින්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

----------------------------

**3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

--------------------------------------------

1994 වර්ෂයේ හා 2000 වර්ෂය තුළ මිල දී ගෙන තිබුණු එකතුව රු.833,900 ක් වූ අත් ට්‍රැක්ටර් 02 ක් අළුත්වැඩියා කර, ප්‍රයෝජනයට ගතහැකි මට්ටමේ තිබුණ ද, එසේ කටයුතු නොකර, ස්වභාවික ආපදාවන්ට ලක්වීමට ඉඩහැර තිබුණි.

**3.4.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය මගින් 2008 වර්ෂයේ දී පවරා දුන් රු.750,000 ක් වටිනා කැබ් රථය නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) වර්ෂ 03 ක කාලයක සිට කොම්පෝස්ට් ව්‍යාපෘති ගොඩනැගිල්ල තුළ නවතා තිබූ ට්‍රැක්ටර් ටේලර් 02 ක් අළුත්වැඩියා කර, කසළ එකතු කිරීම සඳහා යොදා ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4.3 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

------------------------------------------

සභාව සතුව පැවති පොදු වෙළඳපොලේ උඩු මහලේ කඩ කාමර 02 ක් විදුලි පහසුකම් නොමැතිකමින් වසා දමා තිබුණි. ඉන් එක් කඩ කාමරයක රෝල දොර කඩා වැටී තිබූ අතර, කඩ කාමර සඳහා පවතින වැසිකිළිය වසර ගණනාවකින් නඩත්තු නොකිරීම නිසා භාවිතා කළ නොහැකි මට්ටමක පැවතුණි.

**3.5 ප්‍රසම්පාදනය**

---------------

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

සභාව විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත විස්තර දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණ බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 09 ක එකතුව රු.19,741,991 ක ඉතිරිවීම් දක්නට ලැබුණු අතර, එම වටිනාකම සියයට 09 සිට සියයට 50 අතර පරාසයක විය.

(ආ) ආදායම් විෂයයන් 06 ක ළඟාකර නොගත් ඉලක්කගත ආදායම් එකතුව රු.15,008,434 ක් වූ අතර, එම වටිනාකම සියයට 03 ත් සියයට 62 අතර පරාසයක විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබීම. |
| | | (ii) | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබීම. |
| (ආ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීමේ දුර්වලතා පැවතීම. |
| | | (ii) | සේවක ණය අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | අක්කර බදු ගෙවිය යුතු ඉඩම් නිවැරදිව හඳුනා නොගැනීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබීම. |
| | | (ii) | වාහන ධාවනය සම්බන්ධයෙන් මාසික සාරාංශ පිළියෙල කර නොතිබීම. |